# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1952/17 – 2016 පෙබරවාරි 02 වැනි අඟහරුවාදා – 2016.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: සී.අයි./1788.

### කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය

එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 02, නවම් මාවත, අයි. බී. එම්. ගොඩනැගිල්ල, 4 වන මහල දරන ස්ථානයේ පිහිටා ඇති ප්‍රිමේටර් ඊස්ට් (පුද්ගලික) සමාගම සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906 දරන ස්ථානයේ පිහිටා ඇති ස්වාධීන තටාක සේවක සංගමය - ප්‍රිමේටර් ඊස්ට් ශාඛාව අතර 2015 ඔක්තෝබර් මස 08 වැනි දින ඇති කර ගන්නා ලද සාමූහික ගිවිසුම (ඉංග්‍රීසි භාෂාවෙන් සහ සිංහල භාෂාවෙන්) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.

### 2015 අංක 33 දරන සාමූහික ගිවිසුම

මෙම සාමූහික ගිවිසුම මෙහි ස්වාමි පක්ෂය වන 4 වන මහල, අයි. බී. එම්. ගොඩනැගිල්ල, නවම් මාවත, කොළඹ 02 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ප්‍රිමේටර් ඊස්ට් (පුද්ගලික) සමාගම සහ මෙහි වෘත්තීය සමිතිය වන තැ.පෙ. 906, තටාක පෙදෙස, කොළඹ වරාය, කොළඹ 15 දරන ස්ථානයේ ලියාපදිංචි කළ ස්වාධීන තටාක සේවක සංගමය - ප්‍රිමේටර් ඊස්ට් ශාඛාව යන දෙපාර්ශ්වය අතර ගිවිසගත් සාමූහික ගිවිසුම් පත්‍රයයි.

ඉහත "ස්වාමි පක්ෂය" සහ ඉහත "වෘත්තීය සමිතිය" නියෝජිතයන් අතර පැවති සාකච්ඡාවලින් පසු සිය සේවකයින්ගේ වැටුප් සහ සේවා කොන්දේසි සංශෝධනය කිරීමට "ස්වාමි පක්ෂය" සහ "වෘත්තීය සමිතිය" පහත සඳහන් අයුරින් එකඟ වේ.

*නාමය.–* මෙම සාමූහික ගිවිසුම 2015 - 2018 ප්‍රිමේටර් ඊස්ට් (පුද්ගලික) සමාගම සහ ස්වාධීන තටාක සේවක සංගමය - ප්‍රිමේටර් ඊස්ට් ශාඛාවේ සාමූහික ගිවිසුම වශයෙන් සඳහන් කරනු ලැබේ.

01. *සාමූහික ගිවිසුම මගින් ආවරණය වන සේවකයින්.–* ආයතනයේ කළමනාකරණ ශ්‍රේණියට අයත් නොවන ආයතනය විසින් ස්ථිර කර ඇති සේවකයන් මෙම ගිවිසුමෙන් ආවරණය වෙයි.

02. ***ගිවිසුම බලපවත්වන කාල පරිච්ඡේදය.***– මෙම සාමූහික ගිවිසුම 2015 මාර්තු මස 01 වැනි දින සිට 2018 පෙබරවාරි මස 28 වැනි දින දක්වා ක්‍රියාත්මක වන අතර මෙම ගිවිසුම නව සාමූහික ගිවිසුමක් අත්සන් කරන තුරු බල පැවැත්වේ. එමෙන්ම එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත මාස 6ක ලිඛිත දැනුම්දීමක් ලබා දීමෙන් පසු අවසන් කරනු ලැබුවේ නම් මිස, අඛන්ඩව බලාත්මකව පවතී. එසේ වුවද, වර්ෂ 2017 සැප්තැම්බර් මස 01 දින හෝ දිනට පෙර පාර්ශ්වයන් දෙකෙන් එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත එවැනි දැන්වීමක් ලබා නොදිය යුතු අතර, වර්ෂ 2018 පෙබරවාරි 28 වැනි දිනට පෙර සාමූහික ගිවිසුම අවසන් කරනු නොලැබිය යුතුය. වර්ෂ 2017 සැප්තැම්බර් 01 දිනට පෙර යම් පාර්ශ්වයක් විසින් දෙනු ලබන ගිවිසුම් අවසන් කිරීමේ දැන්වීමක් කවර ආකාරයකින් හෝ බලාත්මක නොවේ. ඉහත සඳහන් කොනදේසි 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 09 වගන්තියට අනුකූලව බලාත්මක වේ.

03. ***කලින් තිබූ ගිවිසුම්.***– මෙම ගිවිසුම, මෙයට පෙර අත්සන් කරන ලද ආරාවුල් බේරුම් කරන කොන්දේසි ගිවිසුම් සහ අනෙකුත් සියලුම ගිවිසුම් සියල්ල අහෝසි වී ඒ සියල්ල අභිබවා බලාත්මක වන්නේය.

04. *ආයතනයේ සේවා කාලයන්*

දිවා සේවා මුරය
*සඳුදා සිට සිකුරාදා*
පෙ.ව. 7.30 සිට පෙ.ව. 11.50
පෙ.ව. 11.50 සිට ප.ව. 12.30 (දිවා ආහාරය)
ප.ව. 12.30 සිට ප.ව. 4.00

*සෙනසුරාදා*
පෙ.ව. 7.30 සිට ප.ව. 12.30

රාත්‍රී සේවා මුරය
*සඳුදා සිට සිකුරාදා*
ප.ව. 7.00 සිට ප.ව. 7.50
ප.ව. 7.50 සිට ප.ව. 8.30 (රාත්‍රී ආහාරය)
ප.ව. 8.30 සිට පෙ.ව. 7.00 (අමතර පැය 3.5 සඳහා අතිකාල දීමනා ගෙවනු ලැබේ.)

*සෙනසුරාදා*
ප.ව. 7.00 සිට පෙ.ව. 7.00 (අමතර පැය 6.5 සඳහා අතිකාල දීමනා ගෙවනු ලැබේ.)

ඉහත රාත්‍රී සේවා මුරයේ ප්‍රමාණාත්මකව වැඩ නොමැති විට එම සියලු සේවක මහතුන් සන්ධ්‍යා සේවාමුරයට එනම් ප.ව.3.00 සිට ප.ව. 8.00 දක්වා වන සේවා මුරයට, ප්‍රමාණාත්මක පෙර දැනුම් දීමකින් පසු ගෙන්වනු ලැබේ. හදිසි අවශ්‍යතාවකදී ඉහත සන්ධ්‍යා මුරයට කැඳවනු ලබූ සේවක මහතුන් රාත්‍රී සේවාමුරයෙහි අඛන්ඩව සේවය කිරීමට සිදුවිය හැකි අතර එසේ කරනු ලබන්නේ නම්, ඉහත සන්ධ්‍යා සේවා මුරයට කැඳවනු ලැබූ සියලු සේවක මහතුන් රාත්‍රී සේවා මුරයට දීර්ඝ කරනු ලැබේ.

රාත්‍රී සේවා මුරයට සියලු සේවක මහතුන් අවශ්‍ය නොවන විටක අවශ්‍ය සේවක මහතුන් පමණක් රඳවා ගන්නා අතර එසේ කරනු ලබන්නේ නම් සියලුම සේවක මහතුන්ගේ වෘත්තියට අනුව සාධාරණ අයුරින් එය බෙදීයන ආකාරයට රඳවා ගනු ලැබේ.

05. *වැටුප්*

5.1 වැටුප් වර්ධක

සමාගම විසින් සේවක කුසලතාවය මත වැටුප් වර්ධක ලබාදෙන අතර එය පළවෙනි උපලේඛනයේ පරිදි ක්‍රියාත්මක වෙයි. එම වැටුප් වර්ධක 2015 සැප්තැම්බර් 01 වෙනිදා සිට ක්‍රියාත්මක වෙයි.

සේවක මහතුන් හට තම අඩුපාඩු හඳුනාගැනීම සහ එම අඩුපාඩු නිවැරදි කර ගැනීමේ අරමුණින් වාර්ෂික සේවක කුසලතා ඇගයීමේ වාර්ථාවක් සියලුම සේවක මහතුන් වෙත ලිඛිතව නිකුත් කරනු ලැබේ.

5.2 වාර්ෂික මූලික වැටුප් වැඩිවීම

(අ) 2015 සැප්තැම්බර් 01වැනි දා සිට සියලුම සේවක මහතුන්ගේ මූලික වැටුප රුපියල් 2,750/- කින් වැඩි කරනු ලැබේ.

තවද, 2015 සැප්තැම්බර් මස 01 වන දිනට සේවය ස්ථිර කරන ලද දිනයේ සිට සම්පූර්ණ කරන ලද වසර ගණන සඳහා එක් වසරකට රු. 100 බැගින් ගණනය කර, එම ප්‍රමාණය 2015 සැප්තැම්බර් මස මූලික වැටුපට එකතු කරනු ලැබේ.

(ආ) 2016 සැප්තැම්බර් 01වැනි දා සිට සියලුම සේවක මහතුන්ගේ මූලික වැටුප රුපියල් 2,750/- කින් වැඩි කරනු ලැබේ.

තවද, 2016 සැප්තැම්බර් 01 වැනි දිනට සේවය ස්ථිර කරන ලද දිනයේ සිට සම්පූර්ණ කරන ලද වසර ගණන සඳහා එක් වසරකට රු. 115 බැගින් ගණනය කර, එම ප්‍රමාණයෙන් ඉහත 5.2 (අ) අනුව මූලික වැටුපට එකතුකළ ප්‍රමාණය අඩුකර මෙම වසරේ මූලික වැටුපට එකතු කරනු ලැබේ.

(ඇ) 2017 සැප්තැම්බර් 1දා සිට සියලුම සේවක මහතුන්ගේ මූලික වැටුප රුපියල් 2,750/- කින් වැඩි කරනු ලැබේ.

තවද, 2017 සැප්තැම්බර් 01 වැනි දිනට සේවය ස්ථිර කරන ලද දිනයේ සිට සම්පූර්ණ කරන ලද වසර ගණන සඳහා එක් වසරකට රු. 125 බැගින් ගණනය කර, එම ප්‍රමාණයෙන් ඉහත 5.2 (අ) සහ 5.2 (ආ) අනුව මූලික වැටුපට එකතුකළ ප්‍රමාණය අඩුකර මෙම වසරේ මූලික වැටුපට එකතු කරනු ලැබේ.

මෙම ගිවිසුම බලාත්මක වූ දිනයේ සිට පළමු වැටුප් වැඩිවීම සිදු කෙරෙන 2015 සැප්තැම්බර් 30 දක්වා කාලය තුල පඩිපාලක සභාව විසින් හෝ වෙනත් නීතිමය ප්‍රතිපාදනයක් යටතේ සේවක වැටුප් වැඩිකිරීමක් සිදු කරනු ලැබුවහොත් මෙම ගිවිසුම ප්‍රකාර වැටුප් වැඩිවීම සිදු වනුයේ එලෙස නියම කරන ලද වැටුප් වැඩිවීම ඉහත වැටුප් වැඩිවීමෙන් ගලපා අතිරේක ප්‍රමාණයෙනි.

2015 ඔක්තෝබර් 01 සිට 2018 සැප්තැම්බර් 30 දක්වා කාලය තුල පඩිපාලක සභාව විසින් හෝ වෙනත් නීතිමය ප්‍රතිපාදනයක් යටතේ සේවක වැටුප් වැඩිකිරීමක් සිදු කරනු ලැබුවහොත් මෙම ගිවිසුම ප්‍රකාර වැටුප් වැඩිවීම සිදු වනුයේ එලෙස නියම කරන ලද වැටුප් වැඩිවීම ආයතනය ලබා දුන් වැටුප් වැඩිවීමෙන් ගලපා අතිරේක ප්‍රමාණයෙනි.

06. ***සේවක උසස් වීම්***

යම් සේවකයෙකු තම දක්ෂතාවය සහ කුසලතාවය පෙන්නුම් කර තමන් විසින් දැනට දරන පදවියට වඩා උසස් පදවියකට ඉල්ලුම් කළ හැක. එලෙස ඉල්ලුම් කළ සේවකයෙකුගේ සේවය උසස් කරනු ලැබුවහොත් එම සේවකයාගේ වැටුප නව පදවියට අදාල වැටුපට සංශෝධනය කෙරේ.

සියලුම කණ්ඩායම් නායකයින් සඳහා මසකට රු. 1,000.00ක කණ්ඩායම් නායක දීමනාවක් ගෙවනු ලබන අතර, යම්කිසි කණ්ඩායම් නායකයෙකු විසින් ආයතනය විසින් බලාපොරොත්තු වන කණ්ඩායම් නායක තත්ත්වයේ සේවයක් සැපයීමට අපොහොසත් වුවහොත් ඔහුව කණ්ඩායම් නායක තනතුරෙන් ඉවත් කරනු ලබන අතර එතැන් පටන් ඔහුට හිමි කණ්ඩායම් නායක දීමනාව ගෙවනු නොලැබේ.

දැනට පවතින A, B, C හා D ශ්‍රේණිවලට අයත් සේවක මහතුන්ගේ සේවක කුසලතාවයන් විධිමත් ක්‍රමවේදයකට යටත්ව ඇගයීමට ලක්කොට අදාල ශ්‍රේණි අතර උසස්වීම් ලබා දීමට එකඟ වේ.

තාවකාලික පදනම යටතේ සේවයට බඳවාගෙන තිබෙන සේවක මහතුන් ඔවුන්ගේ නිෂ්පාදන ඵලදායිතාවය, කාර්යක්ෂමතාවය සහ ආයතනයේ පවතින සේවක පුරප්පාඩු යන කාරණා සැලකිල්ලට ගෙන ස්ථිර සේවයට බඳවා ගනු ලැබේ.

07. ***ප්‍රසාද දීමනාව***

**2015 වර්ෂය**

මෙම වර්ෂය සඳහා එක් මසක මූලික වැටුපට සමාන ප්‍රමාණයක් ප්‍රසාද දීමනාව වශයෙන් ගෙවනු ලැබේ. කෙසේ වුවද අනුමත නොකළ වැඩට නොපැමිණි දින සඳහා පහත සඳහන් පරිදි ඔහුට හිමි ප්‍රසාද දීමනාවෙන් අඩු කරනු ලැබේ:

| *අනුමත නොකළ වැඩට නොපැමිණි දින ගණන* | *ප්‍රසාද දීමනාවෙන් අඩු කරන ප්‍රතිශතය* |
|---|---|
| දින 31 සිට 32 දක්වා | 10% |
| දින 33 සිට 40 දක්වා | 20% |
| දින 41 සිට 43 දක්වා | 25% |
| දින 44 සිට 100 දක්වා | 30% |
| දින 100 ට වඩා වැඩි | ප්‍රසාද දීමනාවක් නොමැත |

ඉහත අනුමත නොකළ වැඩට නොපැමිණි දින ගණනයේදී, බෝවන රෝග තත්ත්වයන් සඳහා අනුමත නොකළ වැඩට නොපැමිණි දිනයන් සැලකිල්ලට ගනු නොලැබේ.

කිසියම් වසරක ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා සේවයේ නියුක්තව සිට පසු වර්ෂයේ ජනවාරි 01 සහ ප්‍රසාද දීමනාව ගෙවනු ලබන දිනය අතර කාලය තුල විශ්‍රාම ගිය හෝ සේවයෙන් ඉල්ලා අස්වූ සේවක මහතුන් සඳහා වාර්ෂික ප්‍රසාද දීමනාව හිමිවේ.

**2016 වර්ෂය**

මෙම වර්ෂය සඳහා එක් මසක මූලික වැටුපට සමාන ප්‍රමාණයක් ප්‍රසාද දීමනාව වශයෙන් ගෙවනු ලැබේ. කෙසේ වුවද අනුමත නොකළ වැඩට නොපැමිණි දින සඳහා ඉහත සඳහන් පරිදි ඔහුට හිමි ප්‍රසාද දීමනාවෙන් අඩු කරනු ලැබේ.

**2017 වර්ෂය**

මෙම වර්ෂය සඳහා එක් මසක මූලික වැටුපට සමාන ප්‍රමාණයක් ප්‍රසාද දීමනාව වශයෙන් ගෙවනු ලැබේ. කෙසේ වුවද අනුමත නොකළ වැඩට නොපැමිණි දින සඳහා ඉහත සඳහන් පරිදි ඔහුට හිමි ප්‍රසාද දීමනාවෙන් අඩු කරනු ලැබේ.

08. *නිෂ්පාදන ප්‍රසාද දීමනාව*

සෑම වසරකම අප්‍රේල් 10 වැනිදාට පෙර, පෙර වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ටැංකි බ්ලාස්ට්න් කළ වර්ග මීටර ප්‍රමාණය පදනම් කොටගෙන ස්ථාවර නිෂ්පාදන ප්‍රසාද දීමනාවක් සහ මූලික වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස අතිරේක නිෂ්පාදන ප්‍රසාද දීමනාවන් පහත සඳහන් ආකාරයට ලබා දීමට එකඟ වේ.

| *ටැංකි වර්ග මීටර් ප්‍රමාණය* | *ස්ථාවර නිෂ්පාදන ප්‍රසාද දීමනාව රු.* | *අතිරේක නිෂ්පාදන ප්‍රසාද දීමනාව මූලික වැටුපෙන් % ලෙස* |
|---|---|---|
| 0 - 5,000 | 5,000.00 | - |
| 5,001 - 10,000 | 10,000.00 | - |
| 10,001 - 15,000 | 10,000.00 | 10% |
| 15,001 - 20,000 | 12,000.00 | 12% |
| 20,001 - 25,000 | 15,000.00 | 15% |
| 25,001 - 30,000 | 20,000.00 | 20% |
| 30,001 - 35,000 | 25,000.00 | 20% |
| 35,001 - 40,000 | 30,000.00 | 20% |
| 40,001 - 45,000 | 35,000.00 | 20% |
| 45,001 - 50,000 | 40,000.00 | 20% |

කෙසේ වුවද, වර්ෂය සඳහා වන නිෂ්පාදන ප්‍රසාද දීමනාවෙන් ඉහත 7 වැනි වගන්තියේ සඳහන් ආකාරයට සහ එහි දක්වා ඇති ආකාරයට, අනුමත නොකල වැඩට නොපැමිණි දින සඳහා අඩු කරනු ලැබේ. කිසියම් වසරක ජනවාරි මස 01 වැනි දින සහ නිෂ්පාදන ප්‍රසාද දීමනාව ගෙවනු ලබන දිනය අතර කාලය තුල විශ්‍රාම යන හෝ සේවයෙන් ඉල්ලා අස්වන සේවක මහතුන් සඳහා ඉහත සඳහන් නිෂ්පාදන ප්‍රසාද දීමනාව ගෙවනු ඇත.

තවද, නිෂ්පාදන ප්‍රසාද දීමනාව ගණනය කරනු ලබන වසර තුලදී මාස 6කට වැඩි කාලයක් සේවය කර විශ්‍රාම ගන්නා හෝ සේවයෙන් ඉල්ලා අස්වන සේවක මහතුන් සඳහා සේවය කරන ලද මාස ගණන සඳහා සමානුපාතික ක්‍රමයට නිෂ්පාදන ප්‍රසාද දීමනාව ගෙවනු ඇත.

එමෙන්ම නිෂ්පාදන දත්තයන් (ටැංකි බ්ලාස්ට්න් කරන ලද වර්ග මීටර් ප්‍රමාණය) මාස 3කට වරක් ලබා දීමට ආයතනය එකඟ වේ.

09. *තේ සහ කෙටි ආහාර*

සමාගම විසින් දැනට දෙනු ලබන තේ සහ කෙටි ආහාර සැපයීම ඒ ආකාරයෙන්ම තව දුරටත් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

10. *පැමිණීම*

සියලුම සේවක මහතුන් සේවා මුරය ආරම්භ කරන වේලාවට සේවයට වාර්තා කර සිටිය යුතුය. එමෙන්ම රාජකාරි කාලය තුල ඉහළ නිලධාරීන්ගේ අවසරය නොමැතිව වැඩබිමෙන් ඉවත්විය නොහැක. නිසි වේලාවට සේවයට නොපැමිණීම, අක්‍රමවත් පැමිණීම, විෂමාචාරයන් වන හෙයින් ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

ව්‍යවස්ථාපිත නිවාඩු දිනයක් ඉරිදා දිනයක යෙදුන විට ලබාදෙනු ලබන අතිරේක හිලව් නිවාඩු දිනය පැමිණීමේ දීමනාව ගණනය කිරීමේදී ඇතුලත් කරනු ලැබේ.

11. *ඉරිදා, පෝය, ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නිවාඩු දිනවල සේවය කිරීම*

නැව් අලුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ ස්වභාවය අනුව ඉරිදා, පෝය, ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නිවාඩු දිනවල සේවය කිරීමට සිදුවේ. එවැනි අවස්ථාවල සේවයට අවශ්‍ය සේවක මහතුන්ගේ නාම ලේඛනයක් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන අතර, එම දිනවල සාධාරණ හේතුවක් නොමැතිව සේවය කිරීම ප්‍රතික්ෂේප කිරීම, රාජකාරිය නොසලකා හැරීමක් ලෙස සලකා විෂමාචාර චෝදනා මත විනයානුකූල පියවර ගනු ඇත.

ඉහත සඳහන් නිවාඩු දිනයන්වල සේවය ලබාගැනීමට සිදුවන අවස්ථාවලදී, එම දිනයන්වල දෛනික සේවක අවශ්‍යතාවයෙන් අවම වශයෙන් 60% ක ප්‍රමාණයන් ස්ථිර සේවක මහතුන් සේවයේ යෙදවීමට ආයතනය එකඟ වේ.

එමෙන්ම එම දිනවල කරන ලද සේවය සඳහා, සාමාන්‍ය වැටුප මෙන් 1 1/2ක ගුණයක් වැටුප් ලෙස ගෙවනු ලැබේ.

තවද, ඉරිදා දින සහ ව්‍යවස්ථාපිත නිවාඩු දිනවල වැඩ කරන සේවක මහතුන් සඳහා හිලව් නිවාඩුවක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. ඉරිදා දින සඳහා වන හිලව් නිවාඩුව, එම සතියේ ඊළඟ දින පහ ඇතුලත සමාගම අභිමත දිනයක දෙනු ලැබේ. එසේ ලබාදීමට සමාගම අපොහොසත් වුවහොත් එම හිලව් නිවාඩු එම වසරේ දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලියට බාධාවක් නොවන පරිදි සේවකයාගේ හා සේව්‍යයාගේ කැමැත්ත පරිදි ලබාදෙනු ලැබේ. ව්‍යවස්ථාපිත දින සඳහා වන හිලව් නිවාඩුව, එම වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට පෙර සමාගම අභිමත දිනයක දෙනු ලැබේ.

12. *වාර්ෂික නිවාඩු*

සේවකයිනට වාර්ෂික නිවාඩු 24ක් හිමිවේ. එය පහත ආකාරයට භාවිතා කළ හැක:
(අ) මසකට ලබාගත හැකි උපරිම ප්‍රමාණය 5කි.
(ආ) සේව්‍යාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

13. *ලෙඩ නිවාඩු/කෙටි නිවාඩු*

මෙම ගිවිසුමෙන් ආවරණය වන සියලුම සේවක මහතුන්ට වැටුප් සහිත ලෙඩ නිවාඩු 7 කට හිමිකම් ඇත. කෙසේ වුවද එම ලෙඩ නිවාඩුව, ලියාපදිංචි කළ වෛද්‍යවරයකු විසින් සහතික කළ යුතුය.

ස්ථිර පදනමේ සේවක මහතුන් හට ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලියට බාධාවන් නොවන පරිදි හදිසි අවශ්‍යතාවයන් සඳහා එක් වරකට පැය 1.5ක උපරිමයකට යටත්ව මසකට කෙටි නිවාඩු දෙකක් සඳහා හිමිකම් ඇත.

14. *කාර්මික ආරක්ෂාව සහ රක්ෂණය*

හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය මගින් දවසේ පැය 24 තුල ඇතිවන හදිසි අනතුරු ආවරණය කෙරේ. එබැවින් ආයතනය තුල මෙන්ම ඉන් පිටතද සිදුවන හදිසි අනතුරු හේතුකොට ගෙන සිදුවන මරණ සඳහා රු. 1,250, 000.00ක ජීවිත රක්ෂණ ආවරණයක් සියලුම සේවක මහතුන් සඳහා ලබා දෙනු ඇත.

15. *වෛද්‍ය පරීක්ෂණය*

මෙම ගිවිසුමෙන් ආවරණය වන සියලුම සේවක මහතුන් වසරකට වරක් වෛද්‍ය පරීක්ෂණයට යොමු කෙරේ.

16. *රාත්‍රී සේවා මුරය*

දැනට ක්‍රියාත්මක වන මසකට දින 14ක රාත්‍රී සේවාමුරය ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වේ.

17. *සේවක ණය / උත්සව අත්තිකාරම් ණය යෝජනා ක්‍රමය*

ස්ථිර සේවා කාලය අවුරුදු 1 කට වැඩි සේවකයින් සඳහා එක් වරකට රු. 100,000 ක උපරිමයකට යටත්ව සමාන වාරික 12කින් (පොලී රහිත) ආපසු අයකර ගැනීමේ පදනමට යටත්ව, මසකට දෙනු ලබන ණය සංඛ්‍යාව උපරිමය 3කට යටත්වද, පසුගිය අවුරුදු 3 ක කාලය සඳහා කිසිදු ණය මුදලක් ලබා නොමැති සේවක මහතුන් සඳහා සේවා අංක අනුපිළිවෙළට, සමාගමේ ණය දීමේ හැකියාව අනුව, ණය ලබාදීමට කටයුතු කරනු ඇත.

*උත්සව අත්තිකාරම් ලබාදීම*

ආයතනයේ සියලු සේවකමහතුන් සඳහා රුපියල් 12,000/-ක උත්සව අත්තිකාරම් මුදලක් මාස 10 කින් අයකර ගැනීමේ පදනම මත ලබා දෙනු ලැබේ. සේවකයාගේ අවශ්‍යතාව මත හා සමාගමේ මූල්‍යමය හැකියාව අනුව දෙසැම්බර් හෝ අප්‍රේල් මස වසරකට එක් වරක් පමණක් උත්සව අත්තිකාරම් ලබාදෙනු ලැබේ.

18. *විනය ක්‍රියා මාර්ග*

(අ) යම් සේවක මහතෙකු විනය විරෝධී ක්‍රියාවක් කර ඇති විටක ඔහුට විරුද්ධව ආයතනය විසින් විනයානුකූල ක්‍රියාමාර්ග ගනු ඇත.

(ආ) එසේ විනය විරෝධී ක්‍රියාවක් සේවක මහතෙකු කර ඇති බවට ආයතනයට වාර්තා වූ විටක, එම සේවක මහතාට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ඇ) විනය විරෝධී ක්‍රියාවක් සම්බන්ධව සේවක මහතෙකුගේ සේවය අත්හිටුවා ඇති විටක එකී සේවක මහතා විසින් සිදුකර ඇති විනය විරෝධී ක්‍රියා සම්බන්ධව ඔහු වෙත හේතු විමසීමේ ලිපියක් යොමු කරන අතර එකී ලිපියේ දක්වා ඇති දිනට හෝ එයට පෙර සේවක මහතා විසින් එම ලිපියේ දක්වා ඇති කරුණු සම්බන්ධව පිළිතුරු සැපයිය යුතුය.

(ඈ) පිළිතුරු සැපයීම සඳහා ලබාදෙන කාල සීමාව තුල සේවක මහතා විසින් පිළිතුරු සපයනු නොලැබුව හොත් ඒකපාර්ශ්වික පරීක්ෂණයක් සිදුකර ඔහු සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට ආයතනයට හැකිය.

(ඉ) ලබාදී ඇති කාල සීමාව තුල සේවක මහතෙකු විසින් පිළිතුරු සපයනු ලැබුවහොත් එම පිළිතුරු ආයතනය මගින් විමර්ශණය කරනු ලබන අතර එකී පිළිතුරු ආයතනයට පිළිගත නොහැක්කේ නම් හෝ ආයතනය එය ප්‍රතික්ෂේප කරන්නේ නම්, එම සේවක මහතාට විරුද්ධව ඉදිරි විනය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව ආයතනය සතුවේ.

19. ***වෘත්තීය සමිති ක්‍රියා මාර්ග.***- මෙම ගිවිසුම බලාත්මකව පවතින කාලසීමාව තුළදී මෙම ගිවිසුමට අදාළව හෝ ඉන් පැන නගින කරුණු පිළිබඳ කුමන හෝ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට අවතීර්ණ නොවීමට වෘත්තීය සමිතිය සහ සේවක මහතුන් එක්ව සහ වෙන වෙනම එකඟ වේ.

20. *ආරාවුල් විසඳා ගැනීමේ පටිපාටිය.*

(අ) මෙම ගිවිසුම බලාත්මකව පවතින කාලය තුළ දී මෙම ගිවිසුමෙන් ආවරණය නොවන කරුණු සම්බන්ධව පාර්ශ්වයන් අතර යම් ආරාවුලක් පැන නැගුනහොත් එවිට සේවායෝජකයාගේ ආයතනයේ ඇති වෘත්තීය සමිති ශාඛාව විසින් ආරාවුල සේවායෝජකයාගේ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එම ආරාවුල පාර්ශ්වයන් අතර එකඟත්වයෙන් විසඳා ගැනීමට පාර්ශ්වයන් සියලු උත්සාහයන් දැරිය යුතුය.

(ආ) ආරාවුල සම්බන්ධයෙන් පාර්ශ්වයන් අතර කිසිදු සමථයක් ඇති නොවුන හොත්, එම ආරාවුල සේවායෝජකයන් සහ / හෝ ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය වෙත ඉදිරිපත් කරන ලෙස වෘත්තීය සමිති ශාඛාව විසින් වෘත්තීය සමිතියෙන් ඉල්ලා සිටිය යුතු අතර, ඉන්පසු ආරාවුල විසඳීම සඳහා වෘත්තීය සමිතිය, සේවායෝජකයා සහ ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය හැකි සෑම පියවරක්ම ගත යුතුය.

(ඇ) ඉහතින් වූ උප ඡේදයේ සඳහන් පරිදි ආරාවුල සමථයකට පත් කිරීමට නොහැකි වුවහොත්, වෘත්තීය සමිතිය හෝ ආයතනය විසින් එම ආරාවුල කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර කාර්මික ආරාවුල් පනතේ විධිවිධාන යටතේ ආරාවුල විසඳීමට පියවර ගත යුතුය.

21. මෙම සාමූහික ගිවිසුම වලංගුව පවත්නා කාලය තුළ දී පාර්ශ්වයන් විසින්, ඇතිකරගන්නා අන්‍යෝන්‍ය එකඟතාවයකින් හැර, සාමූහික ගිවිසුමේ කිසියම් කොන්දේසියක් හෝ කොන්දේසි, මොනයම් අන්දමක හෝ වෙනස් කිරීම, ඉවත්කර දැමීම හෝ සංශෝධනය කිරීම සිදු කළ නොහැක.

22. සේව්‍යයා, සේවකයින් සහ සමිතිය එකිනෙකා සමඟ සහයෝගය දක්වමින් සමාගමේ නිරන්තර දියුණුවට සහ තත්ත්වය ගැන කැපවීමෙන් කණ්ඩායම් හැඟීමෙන් වැඩ කරන බවට එකඟ වේ.

23. වෘත්තීය සමිතිය සහ සේවකයින් අදාළ ගිවිසුමේ ආකාරයට තමන්ට නියම කර ඇති සේවා කටයුතු හොඳින් සිදුකිරීමට එකඟ වන අතර නිෂ්පාදන අංශයේ සේවකයින් නියමිත නිෂ්පාදන ඉලක්කයන් ලබාදීමට එකඟ වේ.


24. සමාගමේ සියලුම උපකරණ සහ වත්කම් ආරක්ෂා කිරීමට වෘත්තීය සමිතිය සහ සේවකයින් එක්ව සහ වෙන් වෙන්ව එකඟ වේ.

25. දැනට ආයතනයේ සේවකයින් භුක්ති විඳින වරප්‍රසාද එලෙසින්ම ඉදිරියටත් ක්‍රියාත්මක වේ.

26. වෘත්තීය සමිතිය විසින් සියලුම සාමාජික මහතුන් සඳහා හෝ කමිටු නිලධාරි මහතුන් සඳහා කිසියම් ආකාරයක රැස්වීමක් / සාකච්ඡාවක් පැවැත්වීමට අපේක්ෂා කරන්නේ නම් ඒ පිළිබඳව පූර්ව ලිඛිත ඉල්ලීමක් කළමනාකාරිත්වයට ඉදිරිපත් කර අනුමැතියක් ලබාගත යුතුය.

27. සාමූහික ගිවිසුමේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් ව්‍යාකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

මෙයට සාක්ෂි වශයෙන් පාර්ශ්වකරුවන් විසින් කොළඹ දී 2015 ඔක්තෝබර් 08 දින අත්සන් තබන ලදී.


ප්‍රිමේටර් ඊස්ට් (පුද්ගලික) සමාගම වෙනුවෙන්
නම : ඒ.එම්.ඒ.මෙ...
තනතුර : කළමනාකාර අධ්‍යක්ෂක

සාක්ෂි
අත්සන :...............................
නම : එම්.ඒ.අමිල පෙරේරා,
තනතුර : කළමනාකරු - මූල්‍ය සහ පරිපාලන

අත්සන :...............................
නම : එච්.එම්. ලක්ෂ්මන් හේරත්
තනතුර : නිෂ්පාදන කළමනාකරු

ස්වාධීන තටාක සේවක සංගමය - ප්‍රිමේටර් ඊස්ට් ශාඛාව සඳහා සහ වෙනුවෙන්
නම : ...
තනතුර : ලේකම්

සාක්ෂි
අත්සන :...............................
නම : කේ.පී.සෙනෙවිරත්න
තනතුර : සභාපති

අත්සන :...............................
නම : එච්.ඒ.එස්.පී.පෙරේරා
තනතුර : ... ස්වාධීන තටාක සේවක සංගමය

මගේ අංකය: සී.අයි./1703.

උපලේඛන අංක 01

වැටුප් වර්ධක ලබාදෙන ආකාරය

2015 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වැඩිවීම් කොටස් දෙකකට සිදුවන අතර, ඉන් එකක් සියලුම සේවක මහතුන්ට සමාන ප්‍රමාණයකින් වැඩිවන අතර, අනෙක අදාළ සේවක මහතාගේ කුසලතාවයන්ට අනුව පහත පරිදි ගණනය කරනු ලැබේ:

*ලකුණු ගණනය කරන ආකාරය*

| | | | ලකුණු |
|---|---|---|---|
| 1. | කාර්යය පිළිබඳ දැනුම | | 1 - 10 |
| 2. | කරන කාර්යයයෙහි ගුණාත්මකභාවය | | 1 - 10 |
| 3. | කරන කාර්යයයෙහි කාර්යක්ෂමතාවය | | 1 - 10 |
| 4. | වැඩ කෙරෙහි ඇති ආකල්ප සහ ඉහළ නිලධාරීන් සමග සහයෝගයෙන් වැඩ කිරීම | | 1 - 10 |
| 5. | පැමිණීම | | 1 - 20 |
| | අනුමත නොකළ සේවයට වාර්තා නොකිරීම් | - 20 | |
| | අනුමත කළ සේවයට වාර්තා නොකිරීම් (ගෙවීම් රහිත) | - 10 | |
| 6. | වාර්ෂික නිවාඩු | | 1 - 20 |

| සියලුම නිවාඩු කලින් අනුමත කර ඇත | නිවාඩු 1-4 දක්වා කලින් අනුමත කර නොමැත | නිවාඩු 4ට වඩා ලබාගෙන ඇත්තේ කලින් අනුමැතිය නොමැතිවය |
|---|---|---|
| 20 | 10 | 0 |

7. විනය නීති රීති කඩ කිරීම. 1 - 20

| කිසිදු විනයානුකූල පියවරක් ගෙන නොමැත | වරක් ලිඛිතව අනතුරු ඇඟවීමක් කර ඇත | වරකට වඩා ලිඛිතව අනතුරු ඇඟවීම් කර ඇත | දඩ ගසා ඇත | වෙනත් ඕනෑම දඬුවමක් කර ඇත |
|---|---|---|---|---|
| 20 | 14 | 10 | 4 | 2 |

ලබාගත හැකි මුළු ලකුණු සංඛ්‍යාව 100

*වැටුප් වර්ධක ලබාදෙන ආකාරය*

ඒ ඒ සේවක මහතුන්ගේ කුසලතාවය අනුව ඉහත ආකාරයට ලකුණු ලබාදෙන අතර ඔවුන් ලබාගන්නා ලකුණු සංඛ්‍යාවට පහත පරිදි වැටුප් වර්ධක ලබාදීමට කටයුතු කරනු ලැබේ.

| ලකුණු | වැටුප් වර්ධක සංඛ්‍යාව |
|---|---|
| 81 - 100 | 5 |
| 61 - 80 | 4 |
| 41 - 60 | 3 |
| 31 - 40 | 2 |
| 20 - 30 | 1 |
| 0 - 19 | වැටුප් වර්ධක නැත |

| | |
|---|---|
| කාණ්ඩ D | අත් උදව් කරු / ගබඩාකරු |
| කාණ්ඩ C | චිත්‍ර ශිල්පී/ මුනිස්සන් විදින්නන් / මුනිස්සන් විදින්නන් සහ යන්ත්‍ර ශිල්පීය / විදුලි කාර්මික / මින්නාරු සහ යන්ත්‍ර ශිල්පීය / නැව් බඩු හසුරවන්නා / පැස්සුම්කරු / යන්ත්‍ර ශිල්පීය / වේලා තබන්නා |
| කාණ්ඩ B | කාර්මික ශිල්පී / එසළම් යන්ත්‍ර ක්‍රියාකරු / වැඩ සූදානම් කරු / රියදුරු |
| කාණ්ඩ A | මුනිස්සන් විදින්නන්, මින්නාරු කරු සහ යන්ත්‍ර ශිල්පීය / මුනිස්සන් විදින්නන්, මින්නාරු කරු සහ වෙඩි පිකර් ක්‍රියාකරු |

| මට්ටම | කාණ්ඩ D | 180 | කාණ්ඩ C | 194 | කාණ්ඩ B | 205 | කාණ්ඩ A | 225 |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 12,250.00 | Rs.180/- | 13,250.00 | Rs.194/- | 14,750.00 | Rs.205/- | 17,750.00 | Rs.225/- |
| 2 | 12,430.00 | @ 200 | 13,444.00 | @ 200 | 14,955.00 | @ 200 | 17,975.00 | @ 200 |
| 3 | 12,610.00 | | 13,638.00 | | 15,160.00 | | 18,200.00 | |
| 4 | 12,790.00 | | 13,832.00 | | 15,365.00 | | 18,425.00 | |
| 5 | 12,970.00 | | 14,026.00 | | 15,570.00 | | 18,650.00 | |
| 6 | 13,150.00 | | 14,220.00 | | 15,775.00 | | 18,875.00 | |
| 7 | 13,330.00 | | 14,414.00 | | 15,980.00 | | 19,100.00 | |
| 8 | 13,510.00 | | 14,608.00 | | 16,185.00 | | 19,325.00 | |
| 9 | 13,690.00 | | 14,802.00 | | 16,390.00 | | 19,550.00 | |
| 10 | 13,870.00 | | 14,996.00 | | 16,595.00 | | 19,775.00 | |
| 11 | 14,050.00 | | 15,190.00 | | 16,800.00 | | 20,000.00 | |
| 12 | 14,230.00 | | 15,384.00 | | 17,005.00 | | 20,225.00 | |
| 13 | 14,410.00 | | 15,578.00 | | 17,210.00 | | 20,450.00 | |
| 14 | 14,590.00 | | 15,772.00 | | 17,415.00 | | 20,675.00 | |
| 15 | 14,770.00 | | 15,966.00 | | 17,620.00 | | 20,900.00 | |
| 16 | 14,950.00 | | 16,160.00 | | 17,825.00 | | 21,125.00 | |
| 17 | 15,130.00 | | 16,354.00 | | 18,030.00 | | 21,350.00 | |
| 18 | 15,310.00 | | 16,548.00 | | 18,235.00 | | 21,575.00 | |
| 19 | 15,490.00 | | 16,742.00 | | 18,440.00 | | 21,800.00 | |
| 20 | 15,670.00 | | 16,936.00 | | 18,645.00 | | 22,025.00 | |
| 21 | 15,850.00 | | 17,130.00 | | 18,850.00 | | 22,250.00 | |
| 22 | 16,030.00 | | 17,324.00 | | 19,055.00 | | 22,475.00 | |
| 23 | 16,210.00 | | 17,518.00 | | 19,260.00 | | 22,700.00 | |
| 24 | 16,390.00 | | 17,712.00 | | 19,465.00 | | 22,925.00 | |
| 25 | 16,570.00 | | 17,906.00 | | 19,670.00 | | 23,150.00 | |
| 26 | 16,750.00 | | 18,100.00 | | 19,875.00 | | 23,375.00 | |
| 27 | 16,930.00 | | 18,294.00 | | 20,080.00 | | 23,600.00 | |
| 28 | 17,110.00 | | 18,488.00 | | 20,285.00 | | 23,825.00 | |
| 29 | 17,290.00 | | 18,682.00 | | 20,490.00 | | 24,050.00 | |
| 30 | 17,470.00 | | 18,876.00 | | 20,695.00 | | 24,275.00 | |
| 31 | 17,650.00 | | 19,070.00 | | 20,900.00 | | 24,500.00 | |
| 32 | 17,830.00 | | 19,264.00 | | 21,105.00 | | 24,725.00 | |
| 33 | 18,010.00 | | 19,458.00 | | 21,310.00 | | 24,950.00 | |
| 34 | 18,190.00 | | 19,652.00 | | 21,515.00 | | 25,175.00 | |
| 35 | 18,370.00 | | 19,846.00 | | 21,720.00 | | 25,400.00 | |
| 36 | 18,550.00 | | 20,040.00 | | 21,925.00 | | 25,625.00 | |
| 37 | 18,730.00 | | 20,234.00 | | 22,130.00 | | 25,850.00 | |
| 38 | 18,910.00 | | 20,428.00 | | 22,335.00 | | 26,075.00 | |
| 39 | 19,090.00 | | 20,622.00 | | 22,540.00 | | 26,300.00 | |
| 40 | 19,270.00 | | 20,816.00 | | 22,745.00 | | 26,525.00 | |
| 41 | 19,450.00 | | 21,010.00 | | 22,950.00 | | 26,750.00 | |
| 42 | 19,630.00 | | 21,204.00 | | 23,155.00 | | 26,975.00 | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 43 | 19,810.00 | | 21,398.00 | | 23,360.00 | | 27,200.00 | |
| 44 | 19,990.00 | | 21,592.00 | | 23,565.00 | | 27,425.00 | |
| 45 | 20,170.00 | | 21,786.00 | | 23,770.00 | | 27,650.00 | |
| 46 | 20,350.00 | | 21,980.00 | | 23,975.00 | | 27,875.00 | |
| 47 | 20,530.00 | | 22,174.00 | | 24,180.00 | | 28,100.00 | |
| 48 | 20,710.00 | | 22,368.00 | | 24,385.00 | | 28,325.00 | |
| 49 | 20,890.00 | | 22,562.00 | | 24,590.00 | | 28,550.00 | |
| 50 | 21,070.00 | | 22,756.00 | | 24,795.00 | | 28,775.00 | |
| 51 | 21,250.00 | | 22,950.00 | | 25,000.00 | | 29,000.00 | |
| 52 | 21,430.00 | | 23,144.00 | | 25,205.00 | | 29,225.00 | |
| 53 | 21,610.00 | | 23,338.00 | | 25,410.00 | | 29,450.00 | |
| 54 | 21,790.00 | | 23,532.00 | | 25,615.00 | | 29,675.00 | |
| 55 | 21,970.00 | | 23,726.00 | | 25,820.00 | | 29,900.00 | |
| 56 | 22,150.00 | | 23,920.00 | | 26,025.00 | | 30,125.00 | |
| 57 | 22,330.00 | | 24,114.00 | | 26,230.00 | | 30,350.00 | |
| 58 | 22,510.00 | | 24,308.00 | | 26,435.00 | | 30,575.00 | |
| 59 | 22,690.00 | | 24,502.00 | | 26,640.00 | | 30,800.00 | |
| 60 | 22,870.00 | | 24,696.00 | | 26,845.00 | | 31,025.00 | |
| 61 | 23,050.00 | | 24,890.00 | | 27,050.00 | | 31,250.00 | |
| 62 | 23,230.00 | | 25,084.00 | | 27,255.00 | | 31,475.00 | |
| 63 | 23,410.00 | | 25,278.00 | | 27,460.00 | | 31,700.00 | |
| 64 | 23,590.00 | | 25,472.00 | | 27,665.00 | | 31,925.00 | |
| 65 | 23,770.00 | | 25,666.00 | | 27,870.00 | | 32,150.00 | |
| 66 | 23,950.00 | | 25,860.00 | | 28,075.00 | | 32,375.00 | |
| 67 | 24,130.00 | | 26,054.00 | | 28,280.00 | | 32,600.00 | |
| 68 | 24,310.00 | | 26,248.00 | | 28,485.00 | | 32,825.00 | |
| 69 | 24,490.00 | | 26,442.00 | | 28,690.00 | | 33,050.00 | |
| 70 | 24,670.00 | | 26,636.00 | | 28,895.00 | | 33,275.00 | |
| 71 | 24,850.00 | | 26,830.00 | | 29,100.00 | | 33,500.00 | |
| 72 | 25,030.00 | | 27,024.00 | | 29,305.00 | | 33,725.00 | |
| 73 | 25,210.00 | | 27,218.00 | | 29,510.00 | | 33,950.00 | |
| 74 | 25,390.00 | | 27,412.00 | | 29,715.00 | | 34,175.00 | |
| 75 | 25,570.00 | | 27,606.00 | | 29,920.00 | | 34,400.00 | |
| 76 | 25,750.00 | | 27,800.00 | | 30,125.00 | | 34,625.00 | |
| 77 | 25,930.00 | | 27,994.00 | | 30,330.00 | | 34,850.00 | |
| 78 | 26,110.00 | | 28,188.00 | | 30,535.00 | | 35,075.00 | |
| 79 | 26,290.00 | | 28,382.00 | | 30,740.00 | | 35,300.00 | |
| 80 | 26,470.00 | | 28,576.00 | | 30,945.00 | | 35,525.00 | |
| 81 | 26,650.00 | | 28,770.00 | | 31,150.00 | | 35,750.00 | |
| 82 | 26,830.00 | | 28,964.00 | | 31,355.00 | | 35,975.00 | |
| 83 | 27,010.00 | | 29,158.00 | | 31,560.00 | | 36,200.00 | |
| 84 | 27,190.00 | | 29,352.00 | | 31,765.00 | | 36,425.00 | |
| 85 | 27,370.00 | | 29,546.00 | | 31,970.00 | | 36,650.00 | |
| 86 | 27,550.00 | | 29,740.00 | | 32,175.00 | | 36,875.00 | |
| 87 | 27,730.00 | | 29,934.00 | | 32,380.00 | | 37,100.00 | |
| 88 | 27,910.00 | | 30,128.00 | | 32,585.00 | | 37,325.00 | |
| 89 | 28,090.00 | | 30,322.00 | | 32,790.00 | | 37,550.00 | |
| 90 | 28,270.00 | | 30,516.00 | | 32,995.00 | | 37,775.00 | |
| 91 | 28,450.00 | | 30,710.00 | | 33,200.00 | | 38,000.00 | |
| 92 | 28,630.00 | | 30,904.00 | | 33,405.00 | | 38,225.00 | |
| 93 | 28,810.00 | | 31,098.00 | | 33,610.00 | | 38,450.00 | |
| 94 | 28,990.00 | | 31,292.00 | | 33,815.00 | | 38,675.00 | |
| 95 | 29,170.00 | | 31,486.00 | | 34,020.00 | | 38,900.00 | |
| 96 | 29,350.00 | | 31,680.00 | | 34,225.00 | | 39,125.00 | |
| 97 | 29,530.00 | | 31,874.00 | | 34,430.00 | | 39,350.00 | |
| 98 | 29,710.00 | | 32,068.00 | | 34,635.00 | | 39,575.00 | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 99 | 29,890.00 | | 32,262.00 | | 34,840.00 | | 39,800.00 | |
| 100 | 30,070.00 | | 32,456.00 | | 35,045.00 | | 40,025.00 | |
| 101 | 30,250.00 | | 32,650.00 | | 35,250.00 | | 40,250.00 | |
| 102 | 30,430.00 | | 32,844.00 | | 35,455.00 | | 40,475.00 | |
| 103 | 30,610.00 | | 33,038.00 | | 35,660.00 | | 40,700.00 | |
| 104 | 30,790.00 | | 33,232.00 | | 35,865.00 | | 40,925.00 | |
| 105 | 30,970.00 | | 33,426.00 | | 36,070.00 | | 41,150.00 | |
| 106 | 31,150.00 | | 33,620.00 | | 36,275.00 | | 41,375.00 | |
| 107 | 31,330.00 | | 33,814.00 | | 36,480.00 | | 41,600.00 | |
| 108 | 31,510.00 | | 34,008.00 | | 36,685.00 | | 41,825.00 | |
| 109 | 31,690.00 | | 34,202.00 | | 36,890.00 | | 42,050.00 | |
| 110 | 31,870.00 | | 34,396.00 | | 37,095.00 | | 42,275.00 | |
| 111 | 32,050.00 | | 34,590.00 | | 37,300.00 | | 42,500.00 | |
| 112 | 32,230.00 | | 34,784.00 | | 37,505.00 | | 42,725.00 | |
| 113 | 32,410.00 | | 34,978.00 | | 37,710.00 | | 42,950.00 | |
| 114 | 32,590.00 | | 35,172.00 | | 37,915.00 | | 43,175.00 | |
| 115 | 32,770.00 | | 35,366.00 | | 38,120.00 | | 43,400.00 | |
| 116 | 32,950.00 | | 35,560.00 | | 38,325.00 | | 43,625.00 | |
| 117 | 33,130.00 | | 35,754.00 | | 38,530.00 | | 43,850.00 | |
| 118 | 33,310.00 | | 35,948.00 | | 38,735.00 | | 44,075.00 | |
| 119 | 33,490.00 | | 36,142.00 | | 38,940.00 | | 44,300.00 | |
| 120 | 33,670.00 | | 36,336.00 | | 39,145.00 | | 44,525.00 | |
| 121 | 33,850.00 | | 36,530.00 | | 39,350.00 | | 44,750.00 | |
| 122 | 34,030.00 | | 36,724.00 | | 39,555.00 | | 44,975.00 | |
| 123 | 34,210.00 | | 36,918.00 | | 39,760.00 | | 45,200.00 | |
| 124 | 34,390.00 | | 37,112.00 | | 39,965.00 | | 45,425.00 | |
| 125 | 34,570.00 | | 37,306.00 | | 40,170.00 | | 45,650.00 | |
| 126 | 34,750.00 | | 37,500.00 | | 40,375.00 | | 45,875.00 | |
| 127 | 34,930.00 | | 37,694.00 | | 40,580.00 | | 46,100.00 | |
| 128 | 35,110.00 | | 37,888.00 | | 40,785.00 | | 46,325.00 | |
| 129 | 35,290.00 | | 38,082.00 | | 40,990.00 | | 46,550.00 | |
| 130 | 35,470.00 | | 38,276.00 | | 41,195.00 | | 46,775.00 | |
| 131 | 35,650.00 | | 38,470.00 | | 41,400.00 | | 47,000.00 | |
| 132 | 35,830.00 | | 38,664.00 | | 41,605.00 | | 47,225.00 | |
| 133 | 36,010.00 | | 38,858.00 | | 41,810.00 | | 47,450.00 | |
| 134 | 36,190.00 | | 39,052.00 | | 42,015.00 | | 47,675.00 | |
| 135 | 36,370.00 | | 39,246.00 | | 42,220.00 | | 47,900.00 | |
| 136 | 36,550.00 | | 39,440.00 | | 42,425.00 | | 48,125.00 | |
| 137 | 36,730.00 | | 39,634.00 | | 42,630.00 | | 48,350.00 | |
| 138 | 36,910.00 | | 39,828.00 | | 42,835.00 | | 48,575.00 | |
| 139 | 37,090.00 | | 40,022.00 | | 43,040.00 | | 48,800.00 | |
| 140 | 37,270.00 | | 40,216.00 | | 43,245.00 | | 49,025.00 | |
| 141 | 37,450.00 | | 40,410.00 | | 43,450.00 | | 49,250.00 | |
| 142 | 37,630.00 | | 40,604.00 | | 43,655.00 | | 49,475.00 | |
| 143 | 37,810.00 | | 40,798.00 | | 43,860.00 | | 49,700.00 | |
| 144 | 37,990.00 | | 40,992.00 | | 44,065.00 | | 49,925.00 | |
| 145 | 38,170.00 | | 41,186.00 | | 44,270.00 | | 50,150.00 | |
| 146 | 38,350.00 | | 41,380.00 | | 44,475.00 | | 50,375.00 | |
| 147 | 38,530.00 | | 41,574.00 | | 44,680.00 | | 50,600.00 | |
| 148 | 38,710.00 | | 41,768.00 | | 44,885.00 | | 50,825.00 | |
| 149 | 38,890.00 | | 41,962.00 | | 45,090.00 | | 51,050.00 | |
| 150 | 39,070.00 | | 42,156.00 | | 45,295.00 | | 51,275.00 | |
| 151 | 39,250.00 | | 42,350.00 | | 45,500.00 | | 51,500.00 | |
| 152 | 39,430.00 | | 42,544.00 | | 45,705.00 | | 51,725.00 | |
| 153 | 39,610.00 | | 42,738.00 | | 45,910.00 | | 51,950.00 | |
| 154 | 39,790.00 | | 42,932.00 | | 46,115.00 | | 52,175.00 | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 155 | 39,970.00 | | 43,126.00 | | 46,320.00 | | 52,400.00 | |
| 156 | 40,150.00 | | 43,320.00 | | 46,525.00 | | 52,625.00 | |
| 157 | 40,330.00 | | 43,514.00 | | 46,730.00 | | 52,850.00 | |
| 158 | 40,510.00 | | 43,708.00 | | 46,935.00 | | 53,075.00 | |
| 159 | 40,690.00 | | 43,902.00 | | 47,140.00 | | 53,300.00 | |
| 160 | 40,870.00 | | 44,096.00 | | 47,345.00 | | 53,525.00 | |
| 161 | 41,050.00 | | 44,290.00 | | 47,550.00 | | 53,750.00 | |
| 162 | 41,230.00 | | 44,484.00 | | 47,755.00 | | 53,975.00 | |
| 163 | 41,410.00 | | 44,678.00 | | 47,960.00 | | 54,200.00 | |
| 164 | 41,590.00 | | 44,872.00 | | 48,165.00 | | 54,425.00 | |
| 165 | 41,770.00 | | 45,066.00 | | 48,370.00 | | 54,650.00 | |
| 166 | 41,950.00 | | 45,260.00 | | 48,575.00 | | 54,875.00 | |
| 167 | 42,130.00 | | 45,454.00 | | 48,780.00 | | 55,100.00 | |
| 168 | 42,310.00 | | 45,648.00 | | 48,985.00 | | 55,325.00 | |
| 169 | 42,490.00 | | 45,842.00 | | 49,190.00 | | 55,550.00 | |
| 170 | 42,670.00 | | 46,036.00 | | 49,395.00 | | 55,775.00 | |
| 171 | 42,850.00 | | 46,230.00 | | 49,600.00 | | 56,000.00 | |
| 172 | 43,030.00 | | 46,424.00 | | 49,805.00 | | 56,225.00 | |
| 173 | 43,210.00 | | 46,618.00 | | 50,010.00 | | 56,450.00 | |
| 174 | 43,390.00 | | 46,812.00 | | 50,215.00 | | 56,675.00 | |
| 175 | 43,570.00 | | 47,006.00 | | 50,420.00 | | 56,900.00 | |
| 176 | 43,750.00 | | 47,200.00 | | 50,625.00 | | 57,125.00 | |
| 177 | 43,930.00 | | 47,394.00 | | 50,830.00 | | 57,350.00 | |
| 178 | 44,110.00 | | 47,588.00 | | 51,035.00 | | 57,575.00 | |
| 179 | 44,290.00 | | 47,782.00 | | 51,240.00 | | 57,800.00 | |
| 180 | 44,470.00 | | 47,976.00 | | 51,445.00 | | 58,025.00 | |
| 181 | 44,650.00 | | 48,170.00 | | 51,650.00 | | 58,250.00 | |
| 182 | 44,830.00 | | 48,364.00 | | 51,855.00 | | 58,475.00 | |
| 183 | 45,010.00 | | 48,558.00 | | 52,060.00 | | 58,700.00 | |
| 184 | 45,190.00 | | 48,752.00 | | 52,265.00 | | 58,925.00 | |
| 185 | 45,370.00 | | 48,946.00 | | 52,470.00 | | 59,150.00 | |
| 186 | 45,550.00 | | 49,140.00 | | 52,675.00 | | 59,375.00 | |
| 187 | 45,730.00 | | 49,334.00 | | 52,880.00 | | 59,600.00 | |
| 188 | 45,910.00 | | 49,528.00 | | 53,085.00 | | 59,825.00 | |
| 189 | 46,090.00 | | 49,722.00 | | 53,290.00 | | 60,050.00 | |
| 190 | 46,270.00 | | 49,916.00 | | 53,495.00 | | 60,275.00 | |
| 191 | 46,450.00 | | 50,110.00 | | 53,700.00 | | 60,500.00 | |
| 192 | 46,630.00 | | 50,304.00 | | 53,905.00 | | 60,725.00 | |
| 193 | 46,810.00 | | 50,498.00 | | 54,110.00 | | 60,950.00 | |
| 194 | 46,990.00 | | 50,692.00 | | 54,315.00 | | 61,175.00 | |
| 195 | 47,170.00 | | 50,886.00 | | 54,520.00 | | 61,400.00 | |
| 196 | 47,350.00 | | 51,080.00 | | 54,725.00 | | 61,625.00 | |
| 197 | 47,530.00 | | 51,274.00 | | 54,930.00 | | 61,850.00 | |
| 198 | 47,710.00 | | 51,468.00 | | 55,135.00 | | 62,075.00 | |
| 199 | 47,890.00 | | 51,662.00 | | 55,340.00 | | 62,300.00 | |
| 200 | 48,070.00 | | 51,856.00 | | 55,545.00 | | 62,525.00 | |

02 - 496